# 2025 TII දර්ශකය

## (දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම් දර්ශකය)
## (Tobacco Industry Interference Index)

### තොරතුරු පත්‍රිකාව

**ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) දුම්කොළ පාලනය පිළිබඳ නීතිමය රාමුවේ (FCTC) රාජ්‍ය පාර්ශවකරුවන්, 5.3 වගන්තිය සහ එහි ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ භාවිතා කිරීමෙන් ඔවුන්ගේ සෞඛ්‍ය ප්‍රතිපත්ති ආරක්ෂා කිරීමට බැඳී සිටින අතර, එමගින් වාණිජ හා අනෙකුත් නිත්‍ය අවශ්‍යතාවලින් මහජන සෞඛ්‍ය ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීමට ඔවුන්ට බලය ලැබේ.**

## TII දර්ශකය යනු කුමක්ද?

2019 දී දියත් කරන ලද මුලපිරීමක් වන TII දර්ශකය, රජයන් විසින් WHO FCTC හි 5.3 වගන්තිය යටතේ දක්වා ඇති පියවර ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ සිවිල් සමාජ සමාලෝචනයක් වන අතර එහි ආරම්භයේ සිට එය සෑම වසර දෙකකට වරක් පවත්වනු ලැබේ.

## TII දර්ශකය තීරණය කිරීමේ ක්‍රියා පටිපාටිය:

2025 ගෝලීය TII දර්ශකය නැගෙනහිර මධ්‍යධරණී කලාපය, ඇමරිකාව, යුරෝපය, දකුණු සහ අග්නිදිග ආසියාව සහ බටහිර පැසිෆික් කලාපයේ රටවල් 100ක් සමීක්ෂණය කරන ලද අතර, 2023 අප්‍රේල් 1 සිට 2025 මාර්තු 31 දක්වා කාලය තුළ දුම්කොළ කර්මාන්තයේ (TI) මැදිහත්වීම් සහ මෙම මැදිහත්වීමට අදාළ රජයන්ගේ ප්‍රතිචාර පිළිබඳ විවෘතව ලබා ගත හැකි තොරතුරු මත පදනම් වේ.


**"ලකුණු අඩු වන තරමට කාර්ය සාධනය ශක්තිමත් වේ"**

5.3 වගන්තියේ මාර්ගෝපදේශවල නිශ්චිත නිර්දේශ මත පදනම්ව මෙම සිදුවීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වූ නිශ්චිත රජයේ පියවර සහ TI මැදිහත්වීම්වල වාර ගණන සහ බරපතලකම හඳුනා ගැනීමට සහ ප්‍රමාණනය කිරීමට සම්මත ප්‍රශ්නාවලියක් සහ ලකුණු දීමේ ක්‍රමයක් භාවිතා කරන ලදී.

## 2025 ශ්‍රී ලංකා TII දර්ශකයේ ප්‍රධාන සොයාගැනීම්:

1. 2025 ගෝලීය TII දර්ශකයට අනුව, **ශ්‍රී ලංකාව 45 වන ස්ථානයේ සිටී.**
2. 2023 වසරට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ **සමස්ත ලකුණු අගය ලකුණු තුනකින් පිරිහී ඇති** අතර, එය දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම්වල වැඩිවීමක් පෙන්නුම් කරයි.

FIGURE 1: TOBACCO INDUSTRY INTERFERENCE OVERALL COUNTRY RANKING




## ශ්‍රී ලංකා TII දර්ශකයේ පිරිහීමට හේතු වී ඇත්තේ පසුගිය වසර කිහිපය තුළ දුම්කොළ කර්මාන්තය විසින් භාවිතා කරන ලද උපාය මාර්ග කිහිපයක් ය.

- **බැඳියාවන් අතර ගැටුම:** රජයේ නිලධාරීන් සහ දුම්කොළ කර්මාන්ත අතර සම්බන්ධතා
  - ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් සහ ඥාතීන් දුම්කොළ කර්මාන්තයේ මණ්ඩල සහ උපදේශක තනතුරු ඇතුළු භූමිකාවන් දරති.
  - ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් දුම්කොළ සමාගම්වල නායකත්ව භූමිකාවන් දරමින් සිටින හෝ දරා ඇති අතර, එමගින් බැඳියාවන් අතර ගැටුම්වලට අදාළ බරපතල ගැටළු මතු වේ.
- **ආයතනික සමාජ වගකීම (CSR) මුවාවෙන් දුම්කොළ කර්මාන්තයේ සදාචාර විරෝධී ප්‍රතිරූපය යටපත් කරගනිමින් ඔවුන් සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් පෙනී සිටින බව පෙන්වීමට යොදාගන්නා විවිධ උපක්‍රම වලට රජය මැදිහත් කරගැනීම.**

## මෙම අඛණ්ඩ අභියෝග හේතුවෙන්, පහත සඳහන් යෝජිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇති අතර, සමහරක් 2019 සිට තවමත් ක්‍රියාත්මක වී නොමැත.

- රජය විසින් දුම්කොළ නිෂ්පාදන බදු නිවැරදිව එකතු කිරීම සහතික කිරීම සඳහා විද්‍යාත්මක බදු ක්‍රමයක් සංවර්ධනය කිරීම.
- එක දෙක වශයෙන් අලෙවි වන (single stick) සිගරට් අලෙවිය තහනම් කිරීම.
- අධ්‍යාපන ආයතනයක හෝ ආගමික ස්ථානයක සිට මීටර් 100ක් ඇතුළත දුම්කොළ සිල්ලර වෙළඳසැල් පවත්වාගෙන යාම තහනම් කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී (NATA) පනත යටතේ ඇති වැරදි, අත් අඩංගුවට ගතහැකි වැරදි බවට බලාත්මක කිරීම.
- NATA පනතට අදාළ වැරදි සඳහා දඩ සහ දඬුවම් වැඩි කිරීම.
- දුම්කොළ වගාව අධෛර්යමත් කිරීම සහ දුම්කොළ ගොවීන් වෙනත් බෝග වගාවන් වෙත යොමු කිරීම.
- දුම්කොළ කර්මාන්තයේ වෙළඳ සලකුණු වලින් තොර සරල (Plain Packaging) ඇසුරුම්කරණය ක්‍රියාත්මක කිරීම.

## නිර්දේශ:

වාණිජ අරමුණු මත ක්‍රියාත්මක වන උපක්‍රම වලට හසු නොවී මහජන සෞඛ්‍යයට ප්‍රමුඛත්වය ලබා දෙන ලෙසත්, තවදුරටත් ප්‍රමාදයකින් තොරව තීරණාත්මක දුම්කොළ පාලන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කඩිනම් කරන ලෙසත්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන් සහ මහජන සෞඛ්‍ය ප්‍රයත්නයන් තුළ දුම්කොළ කර්මාන්තයේ සියලු ආකාරයේ මැදිහත්වීම් සක්‍රීයව හඳුනා ගැනීම, අභියෝග කිරීම සහ වැළැක්වීම සඳහා සුපරීක්ෂාකාරීව සිටින ලෙසත් ADIC ආයතනය, ප්‍රතිපත්ති සම්පාදකයින්ගෙන් සහ සියලුම අදාළ පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටී.

Global TIII 2025 Report

Sri Lanka TIII 2025 Report

Source: Global Tobacco Industry Interference Index 2025 – Global Centre for Good Governance in Tobacco Control (GGTC), STOP (A Global Tobacco Industry Watchdog) and Asian Tobacco Industry Interference Index 2025 – Southeast Asia Tobacco Control Alliance (SEATCA)

ADIC
Alcohol and Drug Information Centre